**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2013**

----------------------------------------------------------------------------------------------------------------

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1. 4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගය ලෙස එදිනට තොග සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන තොගය වන රු.385,676 ක් දැක්වීම වෙනුවට පොත් ශේෂය වන රු.456,629 දැක්වීම හේතුවෙන් රු.70,953 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ත්‍යාග සහ ආධාර යටතේ ලැබී තිබූ වටිනාකම රු.637,957 ක් වූ පරිගණක 03 ක්, මුද්‍රණ යන්ත්‍රයක් සහ වෑන් රථයක් ඉකුත් වර්ෂවලදී අලෙවි කර තිබූ නමුත්, 2013 දෙසැම්බර් 31 දින වනවිටත් ත්‍යාග සහ ආධාර ගිණුමට ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 නොසැසඳූ පාලන ගිණුම්**

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ "ප්‍රකාශන තොගය" රු.1,142,616 ක් වූ අතර ගබඩා ලේඛන අනුව එදිනට එම ශේෂය රු.1,024,368 ක් වූයෙන් එම ශේෂ අතර රු.118,248 ක වෙනසක් විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව තිබූ එකතුව රු.179,521 ක් වූ වර්ෂ 5 ට වැඩි ණය 2013 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ජංගම බැරකම් යටතේ දක්වා තිබූ වසර 05 කට වඩා වැඩි කාලයක සිට පැවති එකතුව රු.18,249 ක් වූ බැරකම් 02 ක් සහ වසර 02 ක ට වැඩි කාලයක සිට ගිණුම්වල පෙන්වා තිබූ ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු රු.4,000 ක් 2013 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව දෙසැම්බර් 31 දිනට වූ ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩයන් හි ඌනතාවය ඒකක 83 ක් වූ අතර භාණ්ඩ අතිරික්තය 342 ක් විය. මෙම අතිරික්තතා හා ඌනතා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ගයන් ගෙන නොතිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1)වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ එකතුව රු.5,389,165 ක වැටුප් හා දීමනාවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීමේ ලේඛන සහ නිවාඩු ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ගබඩාවේ හා අනෙකුත් අංශවල අබලි භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණ අතර ස්ථාවර වත්කම් ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන උපලේඛනය අතර රු.4,019,813 ක වෙනසක් නිරීක්ෂණය විය. |

**2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

විශ්‍රාම ලැබූ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරයා 2013 අප්‍රේල් 17 දින සිට එම තනතුර සඳහා මාස 06 ක කාලයක් වෙනුවෙන් කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත පමණක් පත්කර ඒ වෙනුවෙන් රු.60,000 ක මාසික දීමනාවක් ගෙවීමට කටයුතු කර තිබුණි. 2013 ඔක්තෝබර් 17 දින සිට ඉදිරියට උපරිම මාස 06 ක කාලයක් සඳහා නැවතත් එම නිලධාරියාගේ සේවය ලබා ගැනීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන තිබුණි. කැබිනට් අනුමැතියකින් තොරව සේවා අවශ්‍යතාවය මත යැයි සඳහන් කර එකී පත්වීම සිදුකර, 2013 අප්‍රේල් 17 දින සිට 2014 අප්‍රේල් 12 දින දක්වා රු.718,064 ක දීමනා ගෙවා තිබූ අතර ජංගම හා සෘජු දුරකථන බිල්පත් වෙනුවෙන් රු.30,607 ක් ප්‍රතිපූරණය කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 3,467,632 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,709,969 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.757,663 කින් වැඩි වී තිබූ අතර එසේ ඌනතාවය වැඩිවීමට පාඨමාලා ආදායම රු.2,469,162 කින් අඩුවීම සහ අධ්‍යයන සේවා වැටුප් හා වේතන රු.2,944,726 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 අධ්‍යයන කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ආයතනය විසින් පවත්වා තිබූ එක් අවුරුදු පාඨමාලා 07 න් බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව, පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව, බෞද්ධායුර්වේද උපදේශන අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා වූ ශිෂ්‍ය ලියාපදිංචිය සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචියෙන් සියයට 16 ක් පමණ විය.

(ආ) සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචිය හා සසඳන විට බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා මුළු ශිෂ්‍ය ලියාපදිංචියෙන් සියයට 82 ක් වූ වැඩි දායකත්වයක් හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (සිංගප්පූරුව) හා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංගප්පූරුව) සඳහා සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචියෙන් සියයට 2 ක් පමණ වූ අඩුම ශිෂ්‍ය දායකත්වයක් විය.

(ඇ) විභාගවලට පෙනී සිටීම හා විභාග ප්‍රතිඵල

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2013 වර්ෂයේ සමස්ථ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 456 ක් වූ අතර, විභාග වලට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 373 ක් හා සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 298 ක් විය.

(ii) ආයතනය විසින් පවත්වනු ලැබූ බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය හා බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද උපාධි හදාරන ලද 203 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂයේදී උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 17 ක් පමණක් විය.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1984 සිට ආරම්භ කර තිබූ ඊ.ඩබ්.ගුණතිලක අරමුදලෙහි 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය වූ රු.226,987 ක් හා විදේශ ශිෂ්‍යත්ව ආධාර රු.736,094 ක් වසර ගණනාවක සිට අදාල අරමුණ සඳහා උපයෝගී කර ගෙන නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.38,212 ක් වූ බැහැර ගෙන යාමට ලබා දී, ආපසු භාරනොදුන් පුස්තකාල පොත් 170 ක් වූ අතර පොත් ලබා ගත් පුද්ගලයන් ස්ථානය හැර ගොස් තිබීම සහ මිය යාම හේතුවෙන් මෙම පොත් ආපසු ලබා ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

### 4.3 සේවක මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ අනුමත කාර්යමණ්ඩලය සැසඳීමේදී පුරප්පාඩු 02 ක් පමණක් පවතින බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

ආයතනය විසින් 2013 වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරි සැලැස්ම නිශ්චිත ආකෘතියකට අනුව හා ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් අනාවරණය කර ගත හැකි වන සේ ක්‍රියාකාරකම, නිම කිරීමට අපේක්ෂිත කාල රාමුව, අයවැයගත ප්‍රතිපාදන, වියදම් මුල්‍යනය කිරීම, අනුමත වගකීම් දරන නිලධාරියා යන කරුණු ද ඇතුළත්ව පිළියෙල කර නොතිබුණි. ක්‍රියාකාරි සැලැස්මේ සඳහන්ව තිබුණු ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කාර්යය හා බෞද්ධ අයුර්වේද උපදේශන පාඨමාලා හා නව පාඨමාලා සඳහා ප්‍රායෝගික අධ්‍යාපනය වෙනුවෙන් නව අංශයක් ස්ථාපිත කිරීම යන කාර්යයන් සමාලෝචිත වර්ෂයේ දී ඉටුකර ගෙන නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදන හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 10 සිට සියයට 161 දක්වා පරාසයක විචලනයන් පැවතිණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ගබඩා පාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) පුස්තකාල පාලනය
(ඉ) වාහන පාලනය